කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය
දෙවන වාර පරීක්ෂණය - 2018

# චිත්‍ර කලාව I

**11 ශ්‍රේණිය** කාලය පැය 01

❖ සැලකිය යුතුයි

- **සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

---

- **පහත සඳහන් රූප සටහන ඇසුරු කරගෙන අංක 01 - 05 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**



01. රමණීය භූමි භාගයක පිහිටි උස් ගල් තලාවක් මත හතරවන බුවනෙකබාහු රජ සමයේ ඉදිකරන ලද මෙය ……………………………. විහාරය නම් වේ.

02. මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි මහල් හතරකින් සමන්විතව තිබූ බැව් සඳහන්වන මෙම විහාරය …………………………….. යුගයට අයත් වේ.

03. මෙහි ඇති පිළිම ගෙයි අභ්‍යන්තරයේ වැඩ සිටිනා බුද්ධ ප්‍රතිමාවේ දෙනෙත් විවෘත ව දක්නට ඇති අතර චීවරයේ රැලි …………………………….. ආකාරයකින් නිමවා ඇත.

04. මෙම විහාරයේ වියන් තලයේ ඇති …………………………….. මෝස්තරය අර්ධ මිත්‍යා සත්ත්ව මෝස්තර සිහිපත් කරවනු ලබයි.

05. මෙම කලාත්මක විහාරය ඉන්දීය ගෘහ නිර්මාණ ශිල්පියෙකුවන …………………………….. විසින් නිර්මාණය කර ඇත.

- **අංක 06 - 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

06. "අවසාන රාත්‍රී භෝජනය" නැමැති සිතුවම නිර්මාණය කළ ශිල්පියා කවුරුන් ද ?
…………………………………………………………………………………………………

07. පිහිටි ගලේ නෙළන ලද ආබද්ධ බුද්ධ ප්‍රතිමා සඳහා පොළොන්නරුවේ වඩා වැදගත් ස්ථානය කුමක් ද ? ……………………………………………………………………


08. ගම්පොළ යුගයේ දී දෙල්මඩ මූලාචාරීන් විසින් දැව මාධ්‍ය භාවිත කර නිමවන ලද වාස්තු විද්‍යා නිර්මාණය කුමක් ද ? ………………………………………………………

Remove Watermark Now

09. හේමමාලා හා දන්ත කුමරු දන්ත ධාතු රැගෙන ඒම නැමැති සිතුවම දක්නට ලැබෙනුයේ කුමන විහාරයක ද? ……………………………………………………

10. මිසරයේ නව රාජධානි යුගයට අයත් තීබ්ස්වල නෙබාමුන් සොහොන් ගැබෙන් හමුවූ වර්ණවත් සිතුවම කුමක් ද? ……………………………………………………

- **ප්‍රශ්න අංක 11 - 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට A, B, C, D, E යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**




11. A අක්ෂරයෙන් දැක්වෙන මූර්ති නිර්මාණය සඳහා යොදාගත් මාධ්‍ය කුමක් ද ? ………………
12. B අක්ෂරයෙන් දැක්වෙන චිත්‍රය නිර්මාණය කළ ශිල්පියා කවුරුන් ද ? ………………………..
13. C අක්ෂරයෙන් දැක්වෙන සිත්තම කුමන නමකින් හඳුන්වන් ලැබේ ද ? ……………………..
14. D අක්ෂරයෙන් 15 වන සියවසට අයත් ශිල්පියෙකුවන මයිකල් ආන්ජලෝ විසින් නිර්මාණය කරන ලද මෙම මූර්තිය කුමන නමකින් හැඳින්වේ ද ? ……………………………………..
15. E අක්ෂරයෙන් දැක්වෙන සිතුවම ඇඳි ශිල්පියා කවුරුන් ද ? ………………………………

- **අංක 16 - 20 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16. ඉන්දු නිම්නයෙන් හමු වූ මොල්ලිය සහිත ගව රූ මුද්‍රාවෙන්,
    1. දෙවියකු නිරූපණය කෙරේ.
    2. ඉන්දු වැසියන් සත්ත්ව රූ වන්දනා මාන කළ බව සනාථ කෙරේ.
    3. ශිවගේ වාහනය වූ නන්දි ගවයා නිරූපණය කෙරේ.
    4. ගවයා පූජනීය සතෙකු බව නිරූපනය කෙරේ.

17. හයරොග්ලිපික්ස් රූපාක්ෂර දැකිය හැකි වන්නේ,
    1. ග්‍රීක චිත්‍රවල පසුබිමේ ය.
    2. මිසර චිත්‍රවල පසුබිමේ ය.
    3. ඉන්දු නිම්න චිත්‍රවල පසුබිමේ ය.
    4. ප්‍රාග් ඓතිහාසික චිත්‍රවල පසුබිමේ ය.

18. පීඩියස් නම් ශිල්පියා සම්භාව්‍ය යුගයේ දී නිර්මාණය කරන ලද නිර්මාණයක් වන්නේ,
    1. ඇතීනා දෙවඟනගේ රුවයි.
    2. ලැඕකූන් මූර්තියයි.
    3. කවපෙත්ත විසිකරන්නා මූර්තියයි.
    4. හර්මිස් හා ඩයෝනීස් මූර්තියයි.



papers.lk pdfelement

Remove Watermark Now

19. ජාතික කලා භවනේ නිත්‍ය කලා ප්‍රදර්ශනයට තබා ඇති උළු පෝරණුව නම් චිත්‍රය නිර්මාණය කර ඇති මාධ්‍ය වන්නේ,

1. කැන්වසය මත තෙල් සායමින්
2. දැව ඵලකය මත මිශ්‍ර මාධ්‍යයෙන්
3. කඩදාසිය මත තෙල් සායමින්
4. කඩදාසිය මත දිය සායමින්

20. ගජමෑන්, සිරිබිරිස් වැනි ජනප්‍රිය කාටූන් චරිත ගණනාවක් නිර්මාණය කළ ශිල්පියා වනුයේ,

1. ඔබ්රි කොලට්
2. ජෙෆ්රි යූනුස්
3. කැමිලස් පෙරේරා
4. ඩබ්.ආර්.විජේසෝම

- **අංක 26 - 30 තෙක් දී ඇති රූප සටහන් කොටස්වලට, සමීප සබඳතාවක් දක්වන රූප සටහන F, G, H, I, J යන රූප සටහන් ඇසුරින් තෝරා එහි අක්ෂරය තිත් ඉරි මත ලියන්න.**

| | | | | |
|---|---|---|---|---|
| 21. |  | (....................................) | F. |  |
| 22. |  | (....................................) | G. |  |
| 23. |  | (....................................) | H. |  |
| 24. |  | (....................................) | I. |  |
| 25. |  | (....................................) | J |  |

papers.lk
pdfelement

Remove Watermark Now

- **අංක 26 - 30 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.**

26. රූපාක්ෂර - ………………………………………………………………...
27. නියඳ කෙඳි - ………………………………………………………………
28. තිරිඟි තලය - ……………………………………………………………...
29. විජ්ජුලතා - ……………………………………………………………...
30. ප්‍රෙස්කෝ බුවනෝ - ……………………………………………………………

- **අංක 31 - 35 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.**

31. තිවංක පිළිමගෙයි බිතු සිතුවම් අතුරෙන් …………………………….. නම් වූ සිතුවමින් බුදු සිරිත හා සම්බන්ධ පුවතක් නිරූපණය කෙරේ.
32. මිසර පාලකයන්ගේ රාජ්‍ය බලය සංකේතවත් කරන නිර්මාණයක් ලෙස …………………………… මූර්තිය හඳුන්වයි.
33. රෆායල් සෙන්ට්ගේ විශිෂ්ට නිර්මාණයක් ලෙස …………………………………… සැලකේ.
34. ඉසුරුමුණියේ පිහිටි ගලේ කෙළා ඇති මිනිසා සහ අශ්ව හිස නිර්මාණයේ මානව රුවෙන් ……………………………………… නිරූපණය වේ.
35. දේවේන්ද්‍ර මූලාචාරීන් නිර්මාණය කරන ලද ……………………………… , දළදා මැඳුරේ විශේෂිත කොටසකි.

- **පහත දැක්වෙන චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.**



(36) හඳුනාගත් බව - ………………………………………………………………...

(37) ශිල්පියා - ………………………………………………………………...

(38) තේමාව - ………………………………………………………………...

(39) ස්ථානය - ………………………………………………………………...

(40) සංරචනය - ………………………………………………………………...

කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය
දෙවන වාර පරීක්ෂණය - 2018

# චිත්‍ර කලාව III

**11 ශ්‍රේණිය** කාලය පැය 01

❖ **සැලකිය යුතුයි**

- **'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන එක චිත්‍රයක් පමණක් අඳින්න.**

---

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. ආගමික ස්ථානයක පුද පූජාවේ යෙදෙන බැතිමතුන් පිරිසක්
2. තුරු සෙවනකට රැස්ව ඇඹුලට සැරසෙන ගොවි ගෙවිලියෝ
3. ඓතිහාසික සිදුවීමක්
4. ධීවර කර්මාන්තයේ යෙදී නියැලී සිටින පිරිසක්

## 'ආ' කොටස - මෝස්තර

5. මැටි බඳුනක් ඇඳ ව්‍යුක්ත හැඩතල ඇසුරින් සැරසිලි කර වර්ණ කරන්න.
6. කුෂන් කවරයක් ඇඳ වර්ණ කරන්න.
7. මේස රෙද්දක් සඳහා සුදුසු නිර්මාණයක් කරන්න.
8. සාරි පල්ලුවක් ඇඳ වර්ණ කරන්න.

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර

9. ඩෙංගු මාරයා පරදවමු යන මාතෘකාව යටතේ පෝස්ටරයක් ඇඳ වර්ණ කරන්න.
10. වෙළඳපොළට අළුතින් හඳුන්වා දෙන ජෑම් වර්ගයක බෝතලයට ලේබලයක් නිර්මාණය කරන්න.
11. පාසලේ පැවැත්වීමට නියමිත කලා උළෙල සඳහා ආරාධනා පත්‍රයක් ඇඳ වර්ණ කරන්න.
12. ළමා පොත් පිටකවරයක් ඇඳ වර්ණ කරන්න.

***



papers.lk pdfelement Remove Watermark Now